**ලුණුගල ප්‍රාදේශීය සභාව - 2023**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලුණුගල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ලුණුගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වටිනාකම රු.192,856 ක් වැඩියෙන් දැක්වීමේ වරද නිවැරදි කිරීමේදී එම වටිනාකම යන්ත්‍රෝපකරණ ගිණුමට බැර කර තිබුණද එයට අදාළ බැර සටහන ගිණුම්ගතකර නොතිබුණි. | සමුච්චිත අරමුදල් ගිණුමේ සිදුවී ඇති වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළව ඉකුත් වර්ෂයේ ලැබී තිබුණු රු.250,881 ක ටෙන්ඩර් කුලී ආදායම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ඉකුත් වර්ෂයේ වෙනත් අයහාර රු.1,502,868 ක් ගිණුම්ගත නොකිරීමේ වරද සමාලෝචිත වර්ෂයේ නිවැරදි කිරීමේදී සමුච්චිත අරමුදලට පමණක් බැර කර තිබුණි. | සිදුව ඇති වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමි ලේඛනය අනුව ඇකිරිය ගම්මාන ජල ව්‍යාපෘතියේ රැඳවුම් මුදල රු.60,438 ක් වුවද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු.153,944 ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | 2021 සහ 2022 වර්ෂ වලට අදාළව වැඩ නිම කළ බවට සනාථ නොකළ කර්මාන්ත 08 ක රු.4,658,596 ක ඇස්තමේන්තුගත වටිනාකම ණයහිමියෝ ලෙස ගිණුම්ගතකර තිබුණි. | ණයහිමි ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඊ) | 2021 වර්ෂයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට මිලදීගැනීම් වෙනුවෙන් වූ රැඳවුම් මුදල රු.48,500 ක් වුවද, එය රු.448,500 ක් ලෙස රු.400,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| (උ) පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ 2021 වර්ෂයේදී එළඹි ගිවිසුමට අදාළ බිල් ප්‍රතිපූර්ණය සමාලෝචිත වර්ෂයේදී සිදුකර තිබුණත් මූල්‍ය ප්‍රකාශනවල රු.112,912 ක් තවදුරටත් ලැබිය යුතු සේ දක්වා තිබුණි. | ප්‍රතිපූර්ණය කර තිබුණු මුදල ණයගැති ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව. | ප්‍රතිපූර්ණය කරන මුදල් ණයගැති ලේඛනයෙන් ඉවත්කර ලේඛන යාවත්කාලීන කළ යුතුය. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,030,248 ක ලිපිද්‍රව්‍ය, ජල උපකරණ හා ඉන්ධන ඇතුළු පාරිභෝගික ද්‍රව්‍ය සඳහා යාවත්කාලීන කළ තොග ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | තුලනය කිරීමට නිලධාරීන්ට උපදෙස් දුන් බව. | උපලේඛන යාවත්කාලීන කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.6,531,373 ක් වූ පොදු තැන්පත් ශේෂය සඳහා විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | යාවත්කාලීන කිරීමට නිලධාරීන්ට උපදෙස් දුන් බව. | -එම- |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| මුදල් රෙගුලාසි 104(4) | සභාවට අයත් වාහන 03කට අදාළව 2018 සහ 2021 වර්ෂවලදී සිදුව තිබුණු අනතුරු සම්බන්ධව පරීක්ෂණ සිදුකර පූර්ණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පූර්ණ වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | අනතුරු සම්බන්ධ පූර්ණ වාර්තා නියමිත කාලයට ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,513,500 ක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.13,972,065 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමන්තු ගත ආදායම<br>රු. | බිල්කල ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31දිනට මුළු හිඟය<br>රු. | ඇස්තමේන්තු ගත ආදායම<br>රු. | බිල්කල ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31දිනට මුළු හිඟය<br>රු. |
| (i) | වරිපනම් හා බදු | 1,082,800 | 1,180,110 | 894,431 | 285,679 | 1,082,800 | 1,180,110 | 717,725 | 462,385 |
| (ii) | කුලී | 4,855,499 | 3,847,290 | 3,418,935 | 428,355 | 7,409,700 | 3,207,707 | 2,018,886 | 1,188,821 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,541,000 | - | 794,016 | - | 1,186,000 | - | 840,634 | (840,634) |
| (iv) | වෙනත් ආදායම් | 3,000,000 | 4,207,220 | 3,881939 | 325,281 | 5,500,000 | 4,384,685 | 1,124,595 | 3,260,090 |
| | එකතුව | 10,479,299 | 9,234,620 | 8,989,321 | 1,039,315 | 15,178,500 | 8,772,502 | 4,701,840 | 4,070,662 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.3,784,071 ක් හා මුද්දර ගාස්තු රු.1,029,154 ක් ගෙන්වාගෙන නොතිබුණි. | ලිඛිත ඉල්ලීම් කර ඇති බව. | හිඟ ආදායම් ගෙන්වාගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23(ආ) වගන්තිය අනුව කටයුතු නොකර කසළ දෛනිකව වෙන්කිරීමෙන් පසු නොදිරන අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන පරිශ්‍රයෙහිම විවෘතව බැහැර කර තිබුණි. | නොදිරන කසළ, කසළ අංගනයේ ස්ථානයක තැන්පත් කර ඇති බව. | කසළ විධිමත්ව බැහැර කළ යුතුය. |
| (ආ) | කසළ බැහැර කිරීම සඳහා 2017 වර්ෂයේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් බදු පදනම මත ඉඩමක් ලබාගෙන රු.6,383,675 ක් වැය කර කසළ අංගන දෙකක්, කොම්පෝස්ට් පොහොර ගබඩා කිරීමේ කාමරයක් කසළ හලන යන්ත්‍රයක් මිළදීගෙන සවිකර තිබුණි. කසළ අංගනයට තෙකලා විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට නොහැකිවීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | කසළ අංගනයට පිවිසුම් මාර්ගය දැඩි අබලන් තත්ත්වය හේතුවෙන් විදුලි ජනන යන්ත්‍රය ප්‍රවාහනය කිරීමට නොහැකිවී ඇති බව සහ මාර්ගය යථා තත්ත්වයට පත්කළ සැනින් අදාළ කටයුතු සිදු කරන බව. | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු කරගැනීම කඩිනමින් සිදු කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව මගින් නඩත්තු කරන ජල ව්‍යාපෘති 05 ක් මගින් ජල පාරිභෝගිකයින් 1143 ක් පානීය ජල අවශ්‍යතාවය සපුරාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එක් ජල ව්‍යාපෘතියක එක් අවස්ථාවකදී ජල සාම්පලවල යෝග්‍යතාවය පරීක්ෂා කර තිබුණු අතර, අනෙකුත් ජල ව්‍යාපෘතිවල ජල සාම්පල පරීක්ෂා කර නොතිබුණි. | මූල්‍ය හා කාර්ය සාධන පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරන බව. | ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව කෙරෙහි අවධානය යොමුකර ජල අවශ්‍යතා සපුරාලිය යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සූරියගොඩ කසළ අංගනයේ විදුලිය අවශ්‍යතාවය සහ බහුකාර්ය ගොඩනැඟිල්ලේ විදුලිය විසන්ධි වීමකදී ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින් රු.4,312,500 ක් වැය කර 20 KVA විදුලි ජනන යන්ත්‍රයක් මිලදීගෙන තිබුණි. ප්‍රාදේශීය සභාවට කිලෝමීටර් 08 ක් දුරකින් පිහිටි කසළ අංගනයට දුෂ්කර මාර්ගයකින් ගමන් කර වරින්වර විදුලි ජනන යන්ත්‍රය ප්‍රවාහනය කිරීමට යන වියදම සහ විදුලි ජනන යන්ත්‍රය කුලියට ලබාදීමෙන් ආදායම් උපයා ගැනීමේ හැකියාව පිළිබඳව ශක්‍යතා අධ්‍යනයක් සිදු නොකර විදුලි ජනන යන්ත්‍රය මිලදීගෙන තිබුණි. | ප්‍රදේශයේ අවශ්‍යතාවය මත විදුලි ජනන යන්ත්‍රය සේවයේ යොදවා ඇති බව. | වත්කම්වල අවශ්‍යතාවය, පිරිවැය සහ නඩත්තුව සැලකිල්ලට ගෙන වත්කම් මිලදීගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී බහුකාර්ය ගොඩනැගිල්ලේ පිටුපස ඉදිකර තිබුණු මුළුතැන්ගෙයි පළමු මහලේ ශාලාව කාමර 03 ක් වශයෙන් වෙන්කර කුලියට දීමට රු.650,904 ක් වටිනා උපකරණ මිලදීගෙන අදාළ කාර්යයන් සඳහා යොදා නොගෙන කාර්යාලයේ ගබඩා කර තිබුණි. | LDSP ව්‍යාපෘතියෙන් කිසිදු ඉදිකිරීමක් සඳහා අවසර ලබා නොදීම හේතුවෙන් උපකරණ මිලදී ගැනීම සිදු කර ඇති බව. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන ආකාරයට අරමුදල් උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | බහුකාර්ය ගොඩනැගිල්ලේ ප්‍රධාන නාම පුවරුව සැකසීම සඳහා ඉදිරිපත් කළ පිරිවිතර අනුව නාම පුවරුවෙහි වානේ අකුරු බිත්තියේ ගල් මත ඇලවීම සඳහා මිල ගණන් ලබාගෙන තිබුණද, පිරිවිතර වලට අනුකූල නොවන ආකාරයට බිත්තියේ හරහට බොක්ස් බාර් පේළි 06 ක් යොදා අකුරු ඇලවීම සිදුකර තිබුණි. මේ සඳහා ගිවිසුම්ගත මුදල වූ රු.350,000 ක් ගෙවා තිබුණි. | ගල් සවි කිරීමේදී දැඩි කම්පනයට පත්වී ගල් බුරුල්වන බැවින්, සිදුරු කිරීමකින් තොරව ඇලුමිනියම් පටි ආධාරයෙන් අකුරු සවිකර ඇති බව. | පිරිවිතරයන්ට අනුව කාර්යයන් සිදුකර ගත යුතුය. |
| (ඈ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ (LDSP) අරමුදලින් රු.445,500 ක් වැය කර වැහි කබා 100 ක් මිලදීගෙන තිබුණි. ගබඩාවේ තිබුණු වැහි කබා 47 ක ලේබල්වල සඳහන් ඒකකයක උපරිම සිල්ලර මිල රු.3,990 ක් වුවද රු.4,455 ක් බැගින් ගෙවීම් කිරීම හේතුවෙන් රු.46,500 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැහි කබා බහාලුම් කිරීමේදී වැරදීමකින් වෙනත් ඇසුරුමක බහා ඇති බව. | මිලදී ගැනීමේ ක්‍රියාවලිය විනිවිදභාවයකින් යුතුව සිදුකළ යුතුය. |
| (ඉ) | ඉඩමේ අයිතිය නිරවුල් කර ගැනීමකින් තොරව 2020 වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ (LDSP) මූල්‍ය ප්‍රතිපාදන වලින් රු.4,459,042 ක් වැය කර ජනතාපුර බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී රු.100,294 ක් වැය කර විදුලි සම්බන්ධතාවයද ලබාගෙන තිබුණි. 2024 පෙබරවාරි වනවිටත් බහුකාර්ය ගොඩනැගිල්ලෙන් ආදායම් උපයාගෙන නොතිබුණි. | කඩ කාමර 02 ක් ටෙන්ඩර් කර දී ඇති අතර, සෙසු කඩ කාමර ටෙන්ඩර් කිරීමට සැලසුම් කර ඇති බවත්, ඉඩමේ අයිතිය නිරවුල් කර ගැනීමට ලුණුගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට යොමු කර ඇති බව. | ප්‍රතිපාදන ඵලදායි කාර්යයක යොදවා ගත යුතුය. |
| (ඊ) | ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජල සම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය දායකත්වයෙන් ජල සාම්පල පරීක්ෂා කිරීමේ පරීක්ෂණාගාරයක් ඉදිකර ප්‍රාදේශීය සභාවට භාරදී තිබුණි. ඒ සඳහා 2021 වර්ෂයේදී අනියම් පදනම මත දිනකට රු.2,500 ක දීමනාවක් ගෙවා රසායනාගාර ශිල්පියෙකු සහ 2023 වර්ෂයේදී සභා අරමුදලින් වැටුප් ගෙවීමේ පදනම මත | මේ වනවිට ජල යෝජනාක්‍රම 05 ක ජල සාම්පල පරීක්ෂාව සිදු කරන බව. | ජල සාම්පල පරීක්ෂණාගාරය පිහිටුවීමේඅරමුණු ඉටු කරගත යුතුය. |

රසායනාගාර සහායකයකු බඳවාගෙන තිබුණද මෙම දෙදෙනා විසින් නගරයේ ජල සැපයුම් මධ්‍යස්ථානයේ ජල සාම්පල පමණක් පරීක්ෂා කර තිබුණි.

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් භාවිත කරනු ලබන ට්‍රැක්ටර් රථ 03 ක සහ ට්‍රැක්ටර් ටේලර් 02 ක අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | පැවරීමට කටයුතු කරන බව. | සභාවට අයත් වාහන වල අයිතිය පවරා ගත යුතුය. |
| (ආ) | රාජ්‍ය නොවන සංවිධානයකින් ලැබී තිබුණු DELL වර්ගයේ DESKTOP පරිගණක 03 න් එක් පරිගණකයක් අස්ථානගත වී තිබුණි. | නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | සභාවට අයත් වත්කම් නැවත සභාව භාරයට ගත යුතුය. |